# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/19 - 2018 අප්‍රේල් මස 03 වැනි අඟහරුවාදා - 2018.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බලයලත් නිලධාරි පත්කිරීම

ඌව පළාතේ පළාත් සභාව

1972 අංක 7 දරන ගෙවල්කුලී පනත

ඌව පළාතේ, පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර විෂයය භාර අමාත්‍ය, අකලන් සෙන්දිල් තොන්ඩමාන් වන මම, 2010 අංක 05 දරන ඌව පළාතේ පළාත් සභාවේ ගෙවල්කුලී ප්‍රඥප්තියේ 5 (1) උප වගන්තිය සමග කියවිය යුතු 1972 අංක 07 දරන ගෙවල්කුලී පනතේ 44 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2017.10.01 වැනි දින සිට ඌව පළාතේ බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙක තුළ 1972 අංක 07 දරන ගෙවල්කුලී පනතේ විධිවිධාන, කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලයලත් නිලධාරියා ලෙස ඌව පළාත් කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරි වාසල බණ්ඩාර ජයසේකර මුදියන්සේලාගේ ජයන්ත පුෂ්පකුමාර මහතා පත්කළ බව මෙයින් නිවේදනය කරමි.

**අකලන් සෙන්දිල් තොන්ඩමාන්,**
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන,
වතු යටිතල පහසුකම් සහ සමුපකාර අමාත්‍ය,
ඌව පළාතේ පළාත් සභාව.

2018 මාර්තු මස 29 වැනි දින,
බදුල්ල,
ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි,
අමාත්‍ය කාර්යාලයේ දී ය.

04 - 627

1A PG 3971 — 10 (2018/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.